
# නව සිහල උරුමය
# Nawa Sihala Urumaya

14 DEC 2007
රාජගිරිය




## ව්‍යවස්ථාව
## Constitution

# පටුන

පරිච්ඡේදය


01. පක්ෂය

02. පක්ෂයේ අභිනව පරමාර්ථ

03. පක්ෂ සාමාජිකත්වය

04. පක්ෂ සංවිධානය

05. විධායක සභාව

06. කෘත්‍යාධිකාරි මණ්ඩලය

07. පක්ෂ සම්මේලනය

08. නිලධාරි මණ්ඩලය

09. තරුණ සංවිධාන

10. කාන්තා සංවිධාන


සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# පක්ෂය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට යටත්ව සම්පූර්ණයෙන්ම ප්‍රජාතාන්ත්‍රවාදීව කටයුතු කරණ අතර , ජාතිවාදී , ආගම්වාදී හෝ නිකායවාදී නොවන පක්ෂයකි.

# නම

සිංහල, ද්‍රවිඩ සහ ඉංග්‍රිසී යන භාෂා තුනෙන්ම නව සිහල උරුමය යන්න හැඳින්විය යුතුය.

# සලකුණ සහ වර්ණ

පක්ෂයේ සලකුණ

වර්ණය කුරහත් පාටය

සත්‍ය පිටපතක් බවට සහතික කරමි

# පක්ෂයේ අභිනව පරමාර්ථ

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පවත්වන මිනැම මැතිවරණයන්හිදී බලය ලබාගැනීමේ අභිප්‍රායෙන් යුතුව ශ්‍රී ලංකාව තුල ප්‍රජාතාන්ත්‍රවාදි දේශපාලන පක්ෂයක් ලෙස සංවිධානය කොට පවත්වාගෙන යාම.

- පක්ෂය විසින් අනුමත කරන ප්‍රතිපත්ති / සැලසුම් සහ වැඩසටහන් පක්ෂය විසින් ක්‍රියාත්මක කිරිම.

- ශ්‍රී ලාංකික පොදු මහජනතාවගේ දේශපාලන/ අධ්‍යාපන/ ආර්ථික/ සමාජ/ සංස්කෘතික උරුමයන් සංවර්ධනය කිරිම/ ආරක්ෂා කිරිම. තවද සර්වබල ඡන්ද බලය සහ පොදු ජනතාවගේ මූලික අයිතිවාසිකම් පිළිගැනිම. ආරක්ෂා කිරිම සහ සංවර්ධනය කිරිම.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# පක්ෂ සාමාජිකත්වය

## <u>සුදුසුකම්</u>

වයස අවුරුදු 16 ට නොඅඩු පක්ෂ ව්‍යවස්ථාව/ පක්ෂයේ විනය / යන කොන්දේසි වලට අනුකූලව කටයුතු කරන ස්ත්‍රී/ පුරුෂ ඕනෑම පුද්ගලයෙකුට පක්ෂය විසින් නියම කරනු ලබන වාර්ෂික සාමාජික මුදල වූ රු. 20.00 ක් ගෙවා පක්ෂ සාමාජිකත්වය ලබාගත හැක. එක් අයෙකුට සාමාජිකත්වය ලබාගත හැක්කේ එක් කොට්ඨාශයක පිහිටි එක ශාඛා සමිතියක පමණි.

## <u>කොන්දේසි</u>

පක්ෂ සාමාජිකත්වය ලබා ගත් දින සිට එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා පක්ෂ සාමාජිකත්වය වලංගු වන අතර නැවත එය ඊළඟ වර්ෂයේ ජනවාරි මස 01 වනදා සිට වලංගු වන පරිදි නියමිත සාමාජික මුදල් ගෙවා සාමාජිකත්වය අලුත් කරවා ගත යුතුය.

පක්ෂ සාමාජිකයින්ට අදාල නීතිරීති සහ සියලු කරුණු සම්බන්ධයෙන් තීන්දු හා තීරණ පක්ෂ සාමාජිකත්වයට පැනවිය හැක. තවද පක්ෂ සාමාජිකත්වය පිළිගන්නා තැනැත්තන් පහත දැක්වෙන කරුණු වලට සම්පූර්ණයෙන් එකඟ විය යුතුය.

- පක්ෂයේ ව්‍යවස්ථාව/ විනය/ මූලධර්ම/ සැලසුම්/ ආචාර ධර්ම/ නීතිරීති සහ ස්ථාවර නියෝග පිළිපැදිය යුතුය.
- පක්ෂයේ අභිවෘද්ධිය සඳහා වෙහෙස මහන්සි වී කටයුතු කල යුතු අතර නායකත්වයට සහ නිලධාරි මණ්ඩලයට අවනත විය යුතුය.
- පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීමෙන් අනතුරුව වෙනත් කිසිදු දේශපාලන පක්ෂයක හෝ දේශපාලනයට සම්බන්ධ සංවිධානයක සාමාජිකත්වය ලබාගත නොහැක.
- පක්ෂය අපකීර්තියට පත් නොකල යුතු අතර පක්ෂය හෝ නායකත්වය හෝ නිලධාරි මණ්ඩලයට එරෙහිව කැරලි ගැසීම හෝ විවේචනය නොකල යුතුයි.
- පක්ෂය විසින් නාම යෝජනා ලබා දෙන අපේක්ෂකයන් ජයග්‍රහනය කිරීමට උපරිම සහයෝගය ලබාදිය යුතු අතර, අපේ අපේක්ෂකයන්ට විරුද්ධව වෙනත් දේශපාලන පක්ෂ වලින් ඉදිරිපත් වන තැනැත්තාට කිසිදු සහයෝගයක් නොදැක්විය යුතුය.
- පක්ෂයෙන් අපේක්ෂකයෙකු හෝ අපේක්ෂකයන්ගේ නම යෝජනා කර නොමැති අවස්ථාවන් වලදී සාමාජිකයන් විසින් අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ බලය පක්ෂයේ නායක හා මහලේකම් සතු අතර එකී විධාන සාමාජිකයින් විසින් පිළිපැදිය යුතුය.
- ශාඛා සමිති/ කොට්ඨාශ බලමණ්ඩල/ දිස්ත්‍රික් සංවිධාන ඇතුළු සෑම සාමාජිකයෙක්ම ඉහත සඳහන් නියෝග හා ප්‍රතිපත්ති පිළිගැනීමට හා ඊට එකඟව කටයුතු කිරීමට ප්‍රතිඥා දිය යුතුය.

සත්‍ය පිටපතක් ...
සහතික කර...

# සාමාජිකත්වය අහෝසි කිරීම.

සාමාජිකයෙක් හෝ කණ්ඩායමක් වෙනත් දේශපාලන හෝ දේශපාලනයට සම්බන්ධ සංවිධානයක හෝ දේශපාලන ආයතනයක හෝ සාමාජිකත්වය ලබාගත හොත් පක්ෂ සාමාජිකත්වය ඉබේම අහෝසි වනු ඇත.

සාමාජිකයෙක් හෝ කණ්ඩායමක් පක්ෂයේ නායක හෝ මහලේකම්ගේ අනුමැතියකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයකින් හෝ දේශපාලන සංවිධානයකින් හෝ දේශපාලන ආයතනයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජය විසින් පවත්වන ඕනෑම මැතිවරණයකදී අපේක්ෂක ධූරයකට නාමයෝජනා ලබා ගැනීම තුලින් පක්ෂ සමාජිකත්වය ඉබේම අහෝසි වනු ඇත.

සාමාජිකයෙක් හෝ කණ්ඩායමක් වෙනත් දේශපාලන හෝ දේශපාලනයට සම්බන්ධ සංවිධානයකින් හෝ දේශපාලන ආයතනයකින් ස්වාධීන කණ්ඩායමකින් ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයක් හෝ වෙනත් ඕනෑම තනතුරක් හෝ තිලයක් දැරීමෙන් පක්ෂ සමාජිකත්වය ඉබේම අහෝසි වනු ඇත.

සාමාජිකයෙක් හෝ කණ්ඩායමක් පාර්ලිමේන්තුවට හෝ පලාත් සභාවකට හෝ පලාත් පාලන ආයතනයක මන්ත්‍රී ධූරයකට තේරිපත් වීමෙන් පසු, පක්ෂයේ නායක හෝ මහලේකම්ගේ පෙර අනුමැතියකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයකින් හෝ දේශපාලන සංවිධානයකින් හෝ දේශපාලන ආයතනයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් පිහිටුවන ලබන හා පාලන තන්ත්‍රයේ මන්ත්‍රී ධූරයක් අමාත්‍ය ධූරයක් හෝ වෙනත් ඕනෑම තනතුරක් හෝ තිලයක් දැරීමෙන් පක්ෂ සමාජිකත්වය ඉබේම අහෝසි වනු ඇත.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# පක්ෂ සංවිධානය

නව සිහල උරුමය පහත සඳහන් ප්‍රධාන සංවිධාන ජාලයකින් සමන්විත වන්නේය.

- ශාඛා සමිති.
- මැතිවරණ කොට්ඨාශ සංවිධාන
- දිස්ත්‍රික් සංවිධාන
- විධායක සභාව
- කෘත්‍යාධිකාරි මණ්ඩලය
- තරුණ සංවිධානය
- කාන්තා සංවිධානය
- පක්ෂ සම්මේලනය

නව සිහල උරුමය යටතේ පහත සඳහන් අනුබද්ධ සංවිධානද පිහිටුවිය හැකිය

- ශිෂ්‍ය සංවිධාන
- සේවක සංවිධාන
- සංස්කෘතික සංවිධාන
- වෛද්‍ය සංවිධාන
- ගොවි සංවිධාන
- නීතිඥ සංවිධාන
- විදේශීය රටවල ශාඛා සංවිධාන

## ප්‍රාදේශීය සංවිධාන

... මූලස්ථානයේ ලියාපදිංචි කරණ ලද ශාඛා සමිති, කොට්ඨාශ බලමණ්ඩල සහ දිස්ත්‍රික් බල ... පක්ෂයේ ප්‍රාදේශීය සංවිධාන ව්‍යුහය වෙයි .

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

## ශාඛා සමිති ව්‍යුහය හා වගකීම්

- පක්ෂයේ මූලික සංවිධාන ඒකකය ශාඛා සමිති වන්නේය. ඡන්ද කොට්ඨාශයක් තුල එක් ග්‍රාම සේවක වසමක් නියෝජනය වන පරිදි ශාඛා සමිතියක් පිහිටුවිය යුතුය . අදාල ග්‍රාම සේවක වසම් නිත්‍ය පදිංචිකරුවන්ගෙන් සාමාජිකයින් සමන්විත යුතුය. අවම සාමාජිකයින් 20 දෙනෙකුගෙන් සමන්විත ශාඛා සමිතියක් පිහිටුවාලිය හැක.

- එක් විටකදී කිසිම සාමාජිකයකුට එක ශාඛාවකට වඩා සාමාජිකත්වය දැරිය නොහැක.

- ශාඛා සමිතියේ සභාපති/ උප සභාපතිවරු දෙදෙනෙක්ද/ ලේකම්/ උපලේකම්/ භාණ්ඩාගාරික සහ කාරක සභයකයින් 10 ගෙන් සැදුම්ලත් නිළධාරි මණ්ඩලයකින් සමන්විත විය යුතුය.

- ග්‍රාමසේවා වසම තුල පක්ෂයේ ප්‍රතිපත්ති/ සැලසුම් හා ප්‍රචාරක කටයුතු වර්ධනය කර පවත්වාගෙන යායුතුය.

- ග්‍රාමසේවා වසම තුල පක්ෂයට පූර්ණකාලීන සාමාජිකයන් බඳවාගත යුතු අතර කාර්යක්ෂම ලෙස පක්ෂ සංවිධාන කටයුතු පවත්වාගෙන ආ යුතුය.

- පවත්වන ඕනෑම මැතිවරණයකදී ග්‍රාමසේවා වසම තුල පක්ෂය ජයග්‍රහණය කිරීමට නොපිරිහෙලා කටයුතු කළ යුතුය.

- ඉහත සඳහන් කරන ලද සියළු කටයුතු පක්ෂයේ ව්‍යවස්ථාවට / නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය.

- ශාඛා සමිතිය මගින් ගනු ලබන සියළු තීරණයන් ශාඛා සමිතියේ ලේකම් විසින් පක්ෂයේ නායකතුමාට එක් දිනක් ඇතුලතදී ලිඛිතව දැනුම් දිය යුතුය.

- පක්ෂයේ ව්‍යවස්ථාවට / නීතිරීති / රෙගුලාසි සහ විනය උල්ලංඝනය කරමින් ක්‍රියාකරන ශාඛා සමිති විසුරුවාලීමේ බලය පක්ෂයේ නායක හා මහ ලේකම්තුමා සතුය.

# මැතිවරණ කොට්ඨාශ බල මණ්ඩල ව්‍යූහය සහ වගකීම්

- පක්ෂයේ නායක විසින් සෑම මැතිවරණ කොට්ඨාශයකටම ප්‍රධාන සංවිධායකවරයෙකු බැගින් පත් කළ යුතුය.

- කොට්ඨාශ බල මණ්ඩලය සභාපති / උප සභාපතිවරු දෙදෙනෙක්ද / ලේකම් / උප ලේකම් / භාණ්ඩාගාරික සහ කාරක සභිකයන් දස දෙදෙනෙකුගෙන් සැදුම්ලත් නිලධාරි මණ්ඩලයකින් සමන්විය යුතුය.

- අදාල මැතිවරණ කොට්ඨාශ බලමණ්ඩල ප්‍රදේශ තුල පිහිටුවා ඇති ශාඛා සමිති වල සභාපතිවරු, ලේකම්වරු සහ භාණ්ඩාගාරිකවරු නිලබලයෙන් මැතිවරණ කොට්ඨාශ බලප්‍රදේශ සංවිධානයේ සාමාජිකයන් ලෙස පත් වේ.

- අදාල මැතිවරණ කොට්ඨාශ බලප්‍රදේශ තුල ක්‍රියාත්මක වන තරුණ හා කාන්තා සංවිධාන වල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන අයද නිල බලයෙන් මැතිවරණ කොට්ඨාශ බලප්‍රදේශ සංවිධානයේ සාමාජිකයින් ලෙස පත් වේ.

- කොට්ඨාශය තුළ පක්ෂයේ ප්‍රතිපත්ති / සැලසුම් සහ ප්‍රචාරක කටයුතු වර්ධනය කර පවත්වාගෙන යායුතුය .

- කොට්ඨාශය තුළ පක්ෂයට පූර්ණකාලීන සාමාජිකයන් බඳවාගත යුතු අතර කාර්‍යක්ෂම ලෙස පක්ෂ සංවිධාන කටයුතු පවත්වාගෙන ආ යුතුය.

- ඉහත සඳහන් කරන ලද සියළු කටයුතු පක්ෂයේ ව්‍යවස්ථාවට / නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය.

- පක්ෂයේ නායක හෝ මහලේකම් විසින් ලබාදෙන ප්‍රතිපත්ති/ සැලසුම් සහ විධිවිධානයන් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කල යුතුය.

- කොට්ඨාශ බලමණ්ඩලය මගින් ගනු ලබන සියළු තීරණයන් බලමණ්ඩලයේ ලේකම් විසින් පක්ෂයේ නායකතුමාට සහ මහලේකම් තුමාට එක් දිනක් ඇතුලතදී ලිඛිතව දැනුම් දිය යුතුය.

- පක්ෂයේ ව්‍යවස්ථාවට / නිතිරීති සහ රෙගුලාසි සහ විනය උල්ලංඝනය කරමින් ක්‍රියාකරණ කොට්ඨාශ බල මණ්ඩල විසුරුවාලීමේ බලය පක්ෂයේ නායක හා මහලේකම්තුමා සතුය.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# දිස්ත්‍රික් බල මණ්ඩලය ව්‍යුහය සහ වගකීම්

දිස්ත්‍රික් බල මණ්ඩලය ව්‍යුහය සහ වගකීම්/ දිස්ත්‍රික් සභාපති/ උප සභාපතිවරු දෙදෙනෙක්ද / ලේකම් / උප ලේකම් / භාණ්ඩාගාරික සහ කාරක සභිකයන් දස දෙනෙකුගෙන් සැදුම්ලත් නිලධාරි මණ්ඩලයකින් සමන්විය යුතුය .

- ❖ දිස්ත්‍රික්කය තුළ පක්ෂයේ ප්‍රතිපත්ති / සැලසුම් සහ ප්‍රචාරක කටයුතු වර්ධනය කර පවත්වාගෙන යා යුතුය.
- ❖ දිස්ත්‍රික්කය තුළ පක්ෂයට පූර්ණකාලීන සාමාජිකයන් බඳවාගත යුතු අතර කාර්යක්ෂම ලෙස පක්ෂ සංවිධාන කටයුතු පවත්වාගෙන ආ යුතුය .
- ❖ පවත්වන ඕනෑම මැතිවරණයකදී දිස්ත්‍රික්කය තුල පක්ෂය ජයග්‍රහණය කිරීමට නොපිරිහෙලා කටයුතු කල යුතුය.
- ❖ ඉහත සඳහන් කරණ ලද සියළු කටයුතු පක්ෂයේ ව්‍යවස්ථාවට / නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය .
- ❖ පක්ෂයේ නායක හා මහ ලේකම් විසින් ලබාදෙන ප්‍රතිපත්ති / සැලසුම් සහ විධිවිධානයන් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කල යුතුය .
- ❖ දිස්ත්‍රික් බල මණ්ඩලය මගින් ගනු ලබන සියළු තීරණයන් බලමණ්ඩලයේ ලේකම් විසින් පක්ෂයේ නායක තුමාට සහ මහලේකම් තුමාට එක් දිනක් ඇතුළතදී ලිඛිතව දැනුම් දිය යුතුය .
- ❖ පක්ෂයේ ව්‍යවස්ථාවට / නීතිරීති / රෙගුලාසි සහ විනය උල්ලංඝනය කරමින් ක්‍රියා කරණ දිස්ත්‍රික් බල මණ්ඩලය විසිරුවාලීමේ බලය පක්ෂයේ නායක හා මහ ලේකම්තුමා සතුය .

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# විධායක සභාව

පක්ෂයේ ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් පක්ෂයේ ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග, නීති රීති හා චර්යාධර්ම ක්‍රියාත්මක කිරීම, සාමාජිකයෙකු හෝ නිළධාරියෙකු නෙරපා හැරීම, සාමාජිකත්වය අත්හිටුවීම ඇතුළු විනය ක්‍රියාමාර්ග, වෙනත් ආකාර ක්‍රියාමාර්ග ගැනීම පක්ෂ ව්‍යවස්ථාව හෝ ස්ථාවර නියෝගයන් සංශෝධන ඉදිරිපත් කිරීම ආදිය ගැන පක්ෂ නායක හා කෘත්‍යාධිකාරි මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ සහාය වීම විධායක සභාව සතු බලතල වේ. විධායක සභාව කැඳවීමේ පූර්ණ බලතල පක්ෂ නායකතුමා සතුය.

විධායක සභාව පහත සඳහන් පරිදි නියෝජිතයින්ගෙන් සමන්විත වන්නේය.

විධායක සභාව සඳහා සාමාජිකයින් 25 දෙනෙකු ඇතුලත්විය යුතුය. එයින් 15 දෙනෙකු පක්ෂ නායකතුමාගේ අභිමතය පරිදි පක්ෂ සාමාජිකයින් අතරින් පත්කල යුතුය. ඉතිරි 10 දෙනා පක්ෂයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ ඒකමතික තීරණය හා අභිමතය පරිදි පක්ෂ සාමාජිකයින් අතුරින් පත්කල යුතුය.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# කාර්‍යාධිකාරි මණ්ඩලය

පක්ෂයේ කාර්‍යාධිකාරි මණ්ඩලය සඳහා නිලධාරින් පක්ෂ සාමාජිකයින්ගෙන් තොරා ගත් 30 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. පක්ෂ නායක විසින් පක්ෂයේ සියළුම නිලධාරින්ගෙන් සහ විධායක සභාවේ සාමාජිකයින් අතුරින් කාර්‍යාධිකාරි මණ්ඩලය සඳහා සාමාජිකයින් පත්කළ යුතුය.

තවද පක්ෂයේ ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් පක්ෂයේ ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග, නීතිරීති, චර්යාධර්ම ක්‍රියාත්මක කිරීම සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු නෙරපා හැරීම, සාමාජිකත්වය අත්හිටුවීම ඇතුළු විනය ක්‍රියාමාර්ග හෝ වෙනත් ආකාර ක්‍රියාමාර්ග ගැනීම පක්ෂ ව්‍යාවස්ථාව හෝ ස්ථාවර නියෝගයන්ට සංශෝධනයන් ඉදිරිපත් කිරීම හා පරිපාලනමය ගැටළු වලදී විධායක සභාවේ සහාය  ලබා ගැනීමට පක්ෂ නායකගේ අභිමතය පරිදි කාර්‍යාධිකාරි මණ්ඩලයට බලය පැවරේ.

තවද පක්ෂයේ ශාඛා සමිති මැතිවරණ කොට්ඨාශ බලමණ්ඩල හා දිස්ත්‍රික් සංවිධාන වල ජාතික ආරවුල් විසඳීම හා පක්ෂ නායක ඇතුළු කාර්‍යාධිකාරි මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර අදාල තීරණයන් පිළිගැනීම අදාල සියලු සංවිධාන බැඳී සිටියි.

තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් පවත්වන ඕනෑම මැතිවරණයක් සම්බන්ධයෙන් අවශ්‍ය සියළු තීන්දු තීරණ කරවා ගැනීම හා නාම යෝජනා මණ්ඩලයක් පත්කිරීම පක්ෂයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සියළු විධිවිධාන් තිකුත් කිරීම කාර්‍යාධිකාරි මණ්ඩලය සතු කාර්යයන්වේ.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# පක්ෂ සම්මේලනය

## රැස්වීම

- වසරක් පුරා පක්ෂ සම්මේලනය පැවැත්විය හැක. පක්ෂ නායක විසින් අවශ්‍ය යැයි තීරණය වූ අවස්ථාවක විශේෂ සම්මේලනයක් කැඳවිය හැක.

- වාර්ෂික හෝ විශේෂ සම්මේලනය තුළින් පක්ෂයේ ප්‍රතිපත්ති / සැලසුම් / සංවිධාන කටයුතු පිළිබඳව තීරණය කරණ අතර එවැනි කටයුතු පිළිබඳව විධානයන් දිය හැක.

- පක්ෂ සම්මේලනයට පක්ෂයේ මහලේකම් විසින් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

- වාර්ෂික සම්මේලනය තුළින් පක්ෂ ව්‍යවස්ථාවට ගෙන ආයුතු සංශෝධන ඉදිරිපත් කර සාමාජිකයින්ගේ තුනෙන් දෙකේ ඡන්දයෙන් සම්මත කර ඇතුලත් කල හැක.

- වාර්ෂික හා විශේෂ සම්මේලනයේදී අනුගමනය කලයුතු ක්‍රියාපටිපාටිය පක්ෂ ස්ථාවර නියෝග වලට අනුකූලව පැවැත්විය යුතුය.

- පක්ෂ සම්මේලනයට පක්ෂයේ සියළුම සාමාජිකයින් හට සහභාගි විය හැක.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# තරුණ සංවිධාන

නව සිහල උරුමයේ තරුණ සංවිධානය යෞවන යෞවනියන් ගේ දේශපාලන සංවිධානය වන අතර වයස අවුරුදු 17-35 අතර ශ්‍රී ලාංකික යෞවන පුරවැසියනට එහි සාමාජිකත්වය ලබා ගත හැකිය.

තරුණ පෙරමුණු පක්ෂ නායකතුමා. විධායක සභාව හා කෘත්‍යාධිකාරී මණ්ඩලයට අවනතවද පක්ෂයේ ව්‍යවස්ථාවට. ස්ථාවර නියෝග වලට මූලධර්මයන්ට. ප්‍රතිපත්ති හා වැඩසටහන් වලට අනුකූලතාවය දැක්විය යුතුය. තවද පක්ෂය විසින් පනවන ලද සියලු නීතිරීති වලට යටත්විය යුතුය.

එක් මැතිවරණ බල ප්‍රදේශයක් ආවරණය වන පරිදි තරුණ පෙරමුණ බැගින් පිහිටුවිය යුතුය.

පක්ෂයේ ව්‍යවස්ථාවට. ස්ථාවර නියෝග වලට. නීතිරීති වලට. මූලධර්මයන්ට. ප්‍රතිපත්ති හා වැඩසටහන් වලට පටහැනිව ක්‍රියාකරන තරුණ සංවිධානයන් විසුරුවාලීමේ බලය පක්ෂ නායකතුමා හා මහලේකම්තුමා සතුය.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# පක්ෂයේ නිලධාරීන්

පක්ෂයේ නායක ධූරයේ පුරප්පාඩුවක් ඇතිවූ විටද විධායක සභාවේ හා කෘත්‍යාධිකාරි මණ්ඩලයේ වැඩිදෙනාගේ එකඟත්වයෙන් පක්ෂයට නව නායකයෙකු පත්කල යුතුය. ඔහුගේ හෝ ඇයගේ පත්වීම වර්ෂ අවසානයේ පවත්වන පක්ෂ සම්මේලනයේදී බහුතර සාමාජිකයන්ගේ කැමැත්ත ලබා ගෙන සම්මත කරගත යුතුය.

තවද සෑම වාර්ෂික සම්මේතයකටම පෙර පක්ෂයේ නායකතුමා විසින් පක්ෂයේ සාමාජිකයන් අතරින් පක්ෂයේ සභාපති, මහලේකම්, භාණ්ඩාගාරික හා ජාතික සංවිධායක යන අය නම් කළ යුතුය. එම ධූරවලට පත් කළ අය වාර්ෂික සම්මේලනයෙන් අනුමත කල යුතුය. සභාපති, මහලේකම්, භාණ්ඩාගාරික හා ජාතික සංවිධායක යන අයගේ ක්‍රියාකාරකම් පිළිබඳව පක්ෂ නායක විසින් තීරණය කරන අතර ඔවුන් සියළු දෙනා පක්ෂ නායකතුමාගෙන් අදහස් විමසා කටයුතු කළ යුතුය. පක්ෂ නායකතුමා නොමැති අවස්ථා වලදී සභාපතිතුමා විධායක සභාවේ හා කෘත්‍යාධිකාරි මණ්ඩලයේ මුලසුන දැරිය යුතුය.

## නිලධාරීන් ඉවත් කිරීම

ශාඛා සමිති, කොට්ඨාශ බලමණ්ඩල සහ දිස්ත්‍රික් බලමණ්ඩල වල නිලධාරීන් ඔවුන්ට පැවරී ඇති වැඩ කටයුතු සහ වගකීම් නිසි ලෙස ඉටුකරලීමට අපොහොසත් වුවහොත් පක්ෂයේ නායක හා මහලේකම් විසින් නියම කරන ප්‍රතිපත්ති/ සැලසුම්/ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වුවහොත්/ පක්ෂ ව්‍යවස්ථාව / නීතිරීති /විනය උල්ලංඝනය වන අයුරින් ක්‍රියාකරණ ඕනෑම තරාතිරමක නිලධාරියෙක්ගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීමට පක්ෂයේ නායක හා මහලේකම් තුමාට බලය ඇත.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි

# කාන්තා සංවිධාන

නව සිහළ උරුමයේ කාන්තා පෙරමුණ කාන්තාවන්ගේ දේශපාලන පෙරමුණ වන අතර වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලාංකික කාන්තාවන්ට එහි සාමාජිකත්වය ලබා ගත හැකිය.

කාන්තා පෙරමුණු පක්ෂ නායකතුමා, විධායක සභාව හා කෘත්‍යාධිකාරී මණ්ඩලයට අවනතවද පක්ෂයේ ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝග වලට මූලධර්මයන්ට, ප්‍රතිපත්ති හා වැඩසටහන් වලට අනුකූලතාවය දැක්විය යුතුය. තවද පක්ෂය විසින් පනවන ලද සියලු නීතිරීති වලට යටත්විය යුතුය.

එක් මැතිවරණ බල ප්‍රදේශයක් ආවරණය වන පරිදි තරුණ පෙරමුණ බැගින් පිහිටුවිය යුතුය.

පක්ෂයේ ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝග වලට, නීතිරීති වලට, මූලධර්මයන්ට, ප්‍රතිපත්ති හා වැඩසටහන් වලට පටහැනිව ක්‍රියාකරන තරුණ සංවිධානයන් විසුරුවාලීමේ බලය පක්ෂ නායකතුමා හා මහලේකම්තුමා සතුය.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි